# රැකියා කරනු ලබන විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන සාර්ථකත්වය

ඒ.ඒ.එස්.ඩී. අධිකාරි[1]

## සංක්ෂේපය

රජය විසින් අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන අතරින් විශ්වවිද්‍යාලය සඳහා වැය වියදම ක්‍රමයෙන් ඉහළ අගයක් ගනී. විද්‍යාර්ථීන්ගේ වියදම් ද ක්‍රමයෙන් ඉහළ නගී. ඒ අනුව විද්‍යාර්ථියා ද තම අධ්‍යයන අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන රැකියා සඳහා යොමුවනු දක්නට හැකිය. බොහෝ පර්යේෂණයන් මඟින් විද්‍යාර්ථියාගේ අධ්‍යයන කටයුතු සඳහා රැකියාවක නිරත වීම සෘණ බලපෑම් ඉහළ මට්ටමක් ගන්නා බැව් දක්වයි. නමුත් සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය උදෙසා රැකියාවක් කිරීම ධනාත්මකව බලපාන්නේ කෙසේද යන්න සොයා බැලීම මෙහි අරමුණ වී ඇත. මෙම පර්යේෂණය සඳහා කැලණිය විශ්වවිද්‍යාලය තුළින් 150 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරා ගත් අතර ඉන් 50% ක් පූර්ණ කාලීන හා අර්ධ කාලීන රැකියා කරනු ලබන විද්‍යාර්ථීන් වූ අතර ඉතිරි පිරිස රැකියා නොකරන විද්‍යාර්ථීන් ද විය. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම, දත්ත විශ්ලේෂණයන් සඳහා යොදා ගන්නා ලදි. මෙහිදී විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතුවල ධනාත්මක හෝ සෘණාත්මක බව මිනිය හැකි ප්‍රමාණාත්මක සාධකය GPA අගය වන බැවින් ප්‍රශ්නාවලියක් තුළින් ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී. අධ්‍යයන මඟින් අනාවරණය වූයේ රැකියාවක් නොකරන සිසුන්ට වඩා සතියට පැය 15-20ත් අතර වැඩ කරන සිසුන් ඉහළ GPA අගයක් පෙන්නුම් කරනු ලබන බවයි. එසේ ම සතියට පැය 1-15ත් අතර පැය ගණනක් වැඩ කරන සිසුන් හා රැකියා නොකරන සිසුන්ට වඩා ඉහළ GPA අගයක් පෙන්නුම් කරයි. එසේම පූර්ණකාලීන රැකියා කරන්නන්ගේ උපාධිය නියමිත කාලය තුල සම්පූර්ණ කර ලබා ගැනීමේ ඉඩකඩ අඩු වනුයේ අර්ධ කාලීන රැකියා කරනු ලබන හෝ රැකියා නොකරන විද්‍යාර්ථීන්ට වඩා 10% ක ප්‍රතිශතයකිනි. අධ්‍යයනය මඟින් සොයාගත් තවත් සාධකයක් වූයේ වැඩි පැය ගණනක් රැකියාව තුළ නිරත වීම විද්‍යාර්ථීන්ගේ සෞඛ්‍යය කෙරෙහි බලපාන බවයි. ඒ අනුව සිසුන් විසින් වැඩ කරනු ලබන පැය ගණන පිළිබඳව නොව සෞඛ්‍යය පිළිබඳව සැලකිලිමත් විය යුතු බවත් රැකියාව තුළින් ලබන පන්නරයත් සමඟ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සමබරව ගෙන යාමට හේතුවන බවත් නිගමනය විය.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථියා, GPA අගය, අධ්‍යයන සාර්ථකත්වය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
samikadinashki@gmail.com